## සංශෝධනයයි

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

අංක 2,485 දරන **2026.04.17** දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද "ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026" සඳහා වන විභාග නිවේදනයේ අනු අංක 5 හි සුදුසුකම් යටතේ දක්වා ඇති **5.2. පළපුරුද්ද** සම්බන්ධයෙන් වන වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

"සිය පත්වීම්වල ස්ථිර කර ඇති, අයදුම්පත් කැඳවීමේ නිවේදනය, *ගැසට්* පත්‍රයේ පළ කරන දිනට හෝ ඊට පෙර ඉහත 5.1 හි සඳහන් සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි වැටුප් කේත අංක MN - 1 - 2025 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන (පූර්වයෙන් වැටුප් කේත අංක MN - 1 හෝ ඊට ඉහළ MN වැටුප් කේත යටතේ වැටුප් ලබා පසුව එම වැටුප් කේත වෙනත් වැටුප් කේතයකට සංශෝධනය කරන ලද සේවා / තනතුරු ද ඇතුළත්ව) හෝ SL - 1 - 2025 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක / තනතුරක අවුරුදු පහකට (05) නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය."

02. මෙම *ගැසට්* නිවේදනය මඟින් අයදුම්කරුවන් මෙම බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය සංශෝධනය නොකෙරේ. ඒ අනුව, බඳවා ගැනීම සඳහා සලකා බලනු ලබන සියලුම සුදුසුකම් මුල් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන ලද දිනය වන **2026.04.17** දිනට සපුරා තිබිය යුතු වේ.

03. තවද, **2026.04.17** දිනැති මුල් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් සියලු විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2026 ජූනි මස 18** දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

04. මෙම විභාගය සඳහා දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 මැයි මස 21 දින.

05 - 369

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.